ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 අගෝස්තු මස 15 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2014 අගෝස්තු

අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඇතැම් ආහාර මිල ගණන්වල ඉහළ යෑම පිළිබිඹු කරමින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන මතුපිට උද්ධමනය පෙර මාසයේ පැවති සියයට 2.8 සිට 2014 ජූලි මාසයේ දී සියයට 3.6 දක්වා ඉහළ ගිය නමුත් එය තවදුරටත් තනි අංකයක මට්ටමේ පැවතුණි. මේ අතර, ඉල්ලුම් පීඩනය තුළින් ඇතිවන මිල විචලනයන් පිළිබිඹු කරන මූලික උද්ධමනය, 2014 ජූනි මාසයේ පැවති සියයට 3.5 ට සාපේක්ෂව 2014 ජූලි මාසයේ දී සියයට 3.7 දක්වා සුළු වශයෙන් වැඩි විය. අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් සැපයුම් අවහිරතා ඇති විය හැකි වුව ද, සාපේක්ෂ වශයෙන් ස්ථාවර ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩ මිල ගණන් මෙන්ම මනාව පාලනය වූ ඉල්ලුම් පීඩන සහ අඩු උද්ධමන අපේක්ෂා හේතුවෙන් ඉදිරියේ දී උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑත කාලීනව ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්ට ප්‍රතිචාර දක්වමින් වෙළෙඳපොළ පොලී අනුපාතික තවදුරටත් අඛණ්ඩව පහළ යමින් පවතී. අඩු උද්ධමනකාරී වාතාවරණයෙහි බලපෑම පිළිබිඹු කරමින්, රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රය පහළට විතැන් වී ඇත. බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය ඇතුළු කෙටිකාලීන පොලී අනුපාතික, මෙතෙක් පැවති අවම මට්ටම දක්වා පහළ ගොස් ඇති අතර, නිවාස ණය පොලී අනුපාතික සහ කල්බදු පොලී අනුපාතික වැනි දිගුකාලීන ණය පොලී අනුපාතික ද අපේක්ෂා කළ පරිදි අඩු වෙමින් පවතී. ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ යෑමට අනුරූපව අඩු වූ තැන්පතු පොලී අනුපාතික, ඒවායේ නව මට්ටම්වල ස්ථාවර වීමක් දක්නට ලැබේ. අඛණ්ඩව පවතින අඩු උද්ධමනය හේතුවෙන් තැන්පතුකරුවන්ට සිය තැන්පතු සඳහා ධනාත්මක මූර්ත

පොලී අනුපාතිකයක් ලැබී ඇති අතර, ඉතුරුම්කරුවන් සඳහා දිගුකාලීනව ඉහළ ප්‍රතිලාභ ලබා දෙන නව තැන්පතු ක්‍රම හඳුන්වා දීම සඳහා මූල්‍ය ආයතන දිරිගැන්වීමක් සිදු වේ.

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වර්ධනය, පෙර මාසයේ වාර්තා වූ සියයට 13 ට සාපේක්ෂව 2014 ජූනි මාසයේ දී සියයට 13.3 ක් විය. පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ජූනි මාසය තුළ දී රුපියල් බිලියන 8 කින් ඉහළ ගිය නමුත් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන පෞද්ගලික අංශයේ ණය වර්ධනය 2014 ජූනි මාසය අවසානයේ සියයට 2 ක් දක්වා අඩු විය. දේශීය මුදල් වෙළෙඳපොළෙහි පවතින ඉහළ ද්‍රවශීලතා මට්ටම, කෙටිකාලීන ණය පොලී අනුපාතික අඩුවීම හා අඩු වෙමින් පවතින දිගුකාලීන පොලී අනුපාතික හේතුවෙන් පෞද්ගලික අංශය මගින් ලබාගන්නා ණය ප්‍රමාණය ක්‍රමයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වසරේ ප්‍රථම භාගය සඳහා දැනට තිබෙන දත්තවලට අනුව, දළ දේශීය නිෂ්පාදිතයෙහි මූර්ත වර්ධනය පුළුල් ලෙස ඉලක්කගත මට්ටමේ පවතිනු ඇත. එසේ වුවත්, නොකඩවා පවතින අඩු උද්ධමනකාරී පරිසරය පිළිබිඹු කරමින්, ගම්‍ය ද.දේ.නි. අවධමනකය, පෙර පුරෝකථනය කළ සියයට 6 ක මට්ටමට වඩා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නාමික ද.දේ.නි. වර්ධනය ද මුලින් පුරෝකථනය කළ සියයට 14.3 ට වඩා අඩු වනු ඇත. ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් සැපයුමේ වර්ධනය 2014 වසර සඳහා මුලින් ඇස්තමේන්තු කළ සියයට 14 ට සාපේක්ෂව 2014 අවසානයේ සියයට 13 ක් පමණ වනු ඇතැයි මහ බැංකුව අපේක්ෂා කරයි.

මහ බැංකුව සහ රජය විසින් ක්‍රියාත්මක කරන ලද කාලීන සහ යෝග්‍ය ප්‍රතිපත්ති හේතුකොට ගෙන මෑත මාසවල දී විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් විය. 2013 ජූනි මාසයේ සිට අපනයනවල දක්නට ලැබුණු හිතකර වර්ධනයන්, 2014 වසරේ ඉතිරි කාලසීමාව තුළ දී ද තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යෑම සහ සංචාරක කර්මාන්තයේ ඉපැයීම් ඉහළ යෑමත් සමග වෙළෙඳ හිඟය අඩු වීම ජංගම ගිණුම සඳහා හිතකර ලෙස බලපාන ලදී. ඒ අනුව, දළ නිල සංචිතය මෙතෙක් වාර්තා කළ ඉහළම අගය වූ එ.ජ.ඩොලර් බිලියන 9 ඉක්මවා ගිය අතර, මේ වන විට එ.ජ.ඩොලර් බිලියන 9.2 ක පමණ මට්ටමේ පවතී. මේ අතර, මහ බැංකුව විසින් වසරේ මේ දක්වා කාලය තුළ එ.ජ.ඩොලර් බිලියනය ඉක්ම වූ විදේශ විනිමය ප්‍රමාණයක් දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙන් ශුද්ධ පදනම මත මිලදී ගන්නා ලදී.

මෙම පසුබිම තුළ, 2014 අගෝස්තු මස 14 වැනි දින පැවති රැස්වීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින් වර්තමානයේ පවතින සියයට 6.50 සහ සියයට 8.00 මට්ටමේ නොවෙනස්ව පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත් කරනු ඇත.

| **මුදල් ප්‍රතිපත්ති තීරණයः** | **ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවතී.** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 6.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 8.00 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 6.00 |